# ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය
# ශාස්ත්‍රවේදී (ගෞරව) උපාධි නිබන්ධ සම්පාදනය පිළිබඳ උපදෙස් පත්‍රිකාව
# (2016 අධ්‍යයන වර්ෂයේ සිට ලියාපදිංචි සිසුන් සඳහා)

ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයෙහි බෞද්ධ අධ්‍යයන හා භාෂා අධ්‍යයන පීඨවලට අයත් සියලු ම අධ්‍යයනාංශවලට අදාළ ව ශාස්ත්‍රවේදී (ගෞරව) උපාධිය සඳහා ඉදිරිපත් කරනු ලබන ස්වාධීන නිබන්ධ පිළියෙල කිරීමේ දී අපේක්ෂකයින් විසින් පහත දැක්වෙන උපදෙස් පිළිපැදිය යුතුය.

1. **පර්යේෂණ යෝජනාව අනුමත කිරීම**

   (අ) සිව්වන වසර ප්‍රථම සමාසිකය ආරම්භ වීමට මසකට පෙර සකස් කරන ලද පර්යේෂණ යෝජනාව අදාළ අධ්‍යයනාංශයට භාර දීම (පර්යේෂකයා සතු වගකීමකි).

   (ආ) ප්‍රථම සමාසිකයේ ප්‍රථම සතිය තුළ දී මාතෘකා අනුමත වීම පිළිබඳ දැන්වීම් පුවරුවෙහි ප්‍රදර්ශනය කිරීම අධ්‍යයනාංශය මගින් සිදු කෙරෙන අතර, සංශෝධන වේ නම් ප්‍රථම සමාසිකයේ දෙවන සතිය තුළ නැවත සකස් කිරීම් සිදු කොට පර්යේෂණ යෝජනාව අදාළ අධ්‍යයනාංශය වෙත යොමු කළ යුතුය.

2. **ප්‍රස්තුතීකරණය**

   අදාළ අධ්‍යයනාංශය මගින් ප්‍රස්තුතීකරණය සිදු කළ යුතු දිනය හා වේලාව දැනුම් දීමෙන් අනතුරු ව නියමිත දින නියමිත වේලාවට ඒ සඳහා සහභාගි වීම අනිවාර්ය වේ.

3. **පර්යේෂණයෙහි ප්‍රගතිය**

   අපේක්ෂකයා තම පර්යේෂණයෙහි මාසික ප්‍රගතිය නිබන්ධ උපදේශකවරයාගේ නිර්දේශය සහිත ව අංශාධිපති වෙත යොමු කළ යුතුය.

4. **ආකෘතිය**

   (අ) නිබන්ධයෙහි පෙළ හොඳ තත්ත්වයේ A4 ප්‍රමාණයේ සුදු කඩදාසියෙහි අක්ෂර 12 ප්‍රමාණයට තනි පිටුවේ පරිගණක අක්ෂර සංයෝජනය කොට තිබිය යුතුය. ප්‍රධාන පෙළ සඳහා ද්වි අන්තර (Double Spacing) ක්‍රමය අනුගමනය කිරීමත්, උපුටා ගැනීම්, අංකකරණය ආදිය සඳහා 1 ½ ලෙසත් පේළි අතර පරතරය යොදා ගත යුතුය.

   (ආ) පරිගණක අක්ෂර සංයෝජනයේ දී සිංහල භාෂාව සඳහා FM Abhaya ද ඉංග්‍රීසි භාෂාව සඳහා Times New Roman ද යොදා ගත යුතුය.

   (ඇ) නිබන්ධයෙහි එන ප්‍රධාන මාතෘකා සහ අනු මාතෘකා සඳහා යොදා ගත යුතු අක්ෂර හා ප්‍රමාණ පහත පරිදි වේ.

   > **ප්‍රධාන මාතෘකාව**
   > (මැදින්, තද කළු අකුරින් 16 ප්‍රමාණය)
   >
   > **අනු මාතෘකාව** (වම් පසින් තද කළු අකුරින් 14 ප්‍රමාණය)
   >
   > **වෙනත් මාතෘකා** (වම් පසින් තද කළු අකුරින් 12 ප්‍රමාණය)

   (ආ) සෑම කඩදාසික ම වම්පස, දකුණු පස හා උඩ, යට පහත පරිදි ඉඩ වෙන් කිරීම සිදු කළ යුතුය.




(ඇ) සියලු ම නිබන්ධ පිටපත් කළු පැහැ බක්රම්/රෙක්සින් ආවරණයෙන් බැඳ සකස් කළ යුතුය. පොත් නාරටියේ පතුලේ සිට අඟල් 1ක් ඉහළින් විශ්වවිද්‍යාලයේ නම ද, අදාළ වර්ෂය ද, අපේක්ෂකයාගේ විභාග අංකය ද රන් (Gold) පැහැති අකුරින් සටහන් කළ යුතුය.




කවරයෙහි මුල් පිටෙහි ඉහළින් මාතෘකාව ද මධ්‍යයෙහි පර්යේෂකයාගේ නම හා විභාග අංකය ද පහළින් වර්ෂය හා මාධ්‍යය ද සඳහන් කළ යුතුය.







## 5. නිබන්ධ ව්‍යුහය

නිබන්ධ ව්‍යුහය පහත සඳහන් කොටස්වලින් සමන්විත විය යුතුය.

i. ග්‍රන්ථනාම පිටුව
ii. නිවැරදි කිරීම් තිබේ නම් ශෝධ්‍ය පත්‍රයක්
iii. නිබන්ධ සාරාංශය
iv. උපකාරානුස්මෘතිය/ පෙරවදන
v. පර්යේෂකයාගේ ප්‍රකාශය
vi. උපදේශක ආචාර්යවයාගේ නිර්දේශය
vii. හැඳින්වීම
viii. පටුන
ix. චිත්‍ර සටහන් හා වගු ආදිය වේ නම් ඒවායෙහි ලැයිස්තු
x. හැකුළුම් හා සංකේත යොදා තිබේ නම් ඒවායෙහි ලැයිස්තු
xi. පාරිභාෂික පද මාලාවන් වේ නම් එම ලැයිස්තුව

xii. ප්‍රධාන පෙළ (අවම පරිච්ඡේද 4කි)
xiii. ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය (Harvard Reference Style)
xiv. අවශ්‍ය නම් අනුක්‍රමණිකාව
xv. උපග්‍රන්ථය

## 6. ග්‍රන්ථ නාම පිටුව

නිබන්ධයේ පළමු පිටුව ග්‍රන්ථ නාම පිටුව විය යුතුය. එය පහත සඳහන් කොටස්වලින් පූර්ණ විය යුතුය.

1 - නිබන්ධයේ පූර්ණ ග්‍රන්ථ නාමය (අක්ෂර ප්‍රමාණය - 18)
2 - අපේක්ෂකයාගේ සම්පූර්ණ නම (අක්ෂර ප්‍රමාණය - 12)
3 - ශාස්ත්‍රවේදී (ගෞරව) උපාධි පාඨමාලාවට අදාළ විෂය පත්‍ර සංකේතය (අක්ෂර ප්‍රමාණය - 14)
4 - විශ්වවිද්‍යාලයේ නම (අක්ෂර ප්‍රමාණය - 16)
5 - නිබන්ධය ඉදිරිපත් කරන ලද වර්ෂය හා මාසය (අක්ෂර ප්‍රමාණය - 14)

## 7. ප්‍රධාන පෙළ (අවම පරිච්ඡේද 4කි)

නිබන්ධ සැලැස්මට අනුව මෙම පරිච්ඡේද රචනා කළ යුතුය. යම් හෙයකින් එය වෙනස් කරන්නේ නම් ඒ සඳහා අදාළ අංශයේ අංශාධිපතිවරයාගේ නිර්දේශය ලබා ගත යුතුය. යම් උපුටාගැනීමක් සිදු කරන්නේ නම් එය මූලාශ්‍රය සහිත ව නිවැරදි ව දැක්විය යුතුය. මූලාශ්‍රය දැක්වීමේ දී ඒ සඳහා Harvard Reference Style යොදා ගත යුතුය.

## 8. ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

මේ සඳහා Harvard Reference Style ක්‍රමය යොදා ගත යුතුය. ප්‍රාථමික මූලාශ්‍රය හා ද්විතීක මූලාශ්‍රය වශයෙන් වෙන් වෙන් ව දැක්විය යුතුය.

## 9. නිබන්ධය ඉදිරිපත් කිරීම

(අ) සිව්වන වසර පළමු සමාසිකය අවසන් වීමට පෙර නිබන්ධයෙහි එක් පරිච්ඡේදයක් අවසන් කොට අදාළ අධ්‍යයනාංශයෙහි අංශාධිපතිගේ නිර්දේශය ලබා ගත යුතුය.

(ආ) අපේක්ෂකයා විසින් ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධි අවසන් පරීක්ෂණය ආරම්භ වීමට සතියකට පෙර හෝ ඊට ප්‍රථම උපදේශක ආචාර්යවරයාගේ නිර්දේශය සහිත ව තම පර්යේෂණ නිබන්ධයෙහි පිටපත් 2ක් ඝන බැම්මෙන් බැඳ (Hard Bound Form) අභ්‍යන්තර විභාග අංශය වෙත භාර දිය යුතුය.

## 10. නිබන්ධය ප්‍රමාද වීම

(අ) නියමිත දිනට පසු එහෙත් අවසන් පරීක්ෂණයේ අවසන් ප්‍රශ්න පත්‍රයට පෙනී සිටීමට පෙර භාර දෙන නිබන්ධ සඳහා 40% සීමාවට යටත් ව ප්‍රතිඵල නිකුත් කෙරේ.

(ආ) අවසන් පරීක්ෂණයේ අවසන් ප්‍රශ්න පත්‍රයට පෙනී සිට මසක් ඇතුළත භාර දෙන ස්වාධීන නිබන්ධ සඳහා 40% සීමාවට යටත් ව ඊළඟ වසරේ ශාස්ත්‍රවේදී (විශේෂ) අවසන් පරීක්ෂණයේ ප්‍රතිඵල සමඟ නිකුත් කෙරේ.